
# 1. අපි අද පන්සල් යමු

තෙල් මල් සුවඳ දුම්
ඔසවා කොඩි ද මනරම්
උපදවා බැති පෙම්
පෙරහැරෙන් ගොස් වදිමු තෙරුවන්

දාගැබ පළමු වැඳ
දෙවනුව වදිමු බෝරද
තෙවනුව පිළිම වැඳ
මෙත් වඩා අපි කරමු මුනිපුද



# 2. සිල් සුරකිමු



මගෙ පණ මෙන් - ඔබෙ පණ මම සලකම්
ඔබෙ හැම දේ - මගෙ මෙන් නිති සුරකිම්

සියලු දෙනා ම දඬුවමට භය වෙති.
සියලු දෙනා ම මරණයට භය වෙති.
තමන් උපමා කොට කිසි ම සත්ත්වයකු නොමරන්න.
බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.



මා ළඟ නොතිබුණත් - මට එය ගන්න සිතුණත්
අන්සතු වූ දෙයක් - හොරෙන් නොගනිමි කිසිවිටත්

# 3. බොදු දරුවෝ



පොඩි හාමුදුරුවරු උදෙන් ම අවදි වෙනවා.

ලස්සන රටාවලට මිදුල් අමදිනවා.





දත් මැද මුහුණ සෝදා තෙරුවන් වඳිනවා
පොඩි හාමුදුරුවෝ කම්මැලි නෑ.
පිළිවෙළට ඔක්කෝම වැඩ කරනවා.

අපිත් උදෙන් ම අවදි වෙලා
අම්මාට තාත්තාට උදවු වෙලා
ගෙවල් මිදුල් අතුගාලා
මූණ කට සෝදලා
පිරිසිදුවට ඇඳගෙන
පිලිවෙළකට වැඩ කරමු.



"උත්සාහය, සිහි ඇති බව, යහපත් වැඩවල යෙදීම,
කම්මැලි නොවීම, දැහැමි ලෙස ජීවත් වීම, පමා නොවී
කටයුතු කිරීම යන කරුණු පිළිපදින තැනැත්තාගේ
කීර්තිය වැඩේ."

- බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක -

# 4. හරිම අගෙයි



පොඩි හාමුදුරුවෝ
පිණ්ඩපාතයේ වඩිනවා.

ගෙයින් ගෙයට වඩිනවා.
ලැබෙන දෙයක් වළඳනවා.

පුංචි හාමුදුරුවෝ
ලැබෙන දෙයින් සතුටු වෙනවා
හරිම අගෙයි.

පුංචි අපිත්
දකින දකින දේවල්
ඉල්ලන්නේ නෑ.
අම්මාට තාත්තාට කරදර
කරන්නේ නෑ.

අපි අම්මා, තාත්තා,
දෙන දෙයින් සතුටු වෙමු.

# 5. බෝසත් මුවා

ඉස්සර කාලේ රජ කෙනෙක් හිටියා. ඒ රජ්ජුරුවෝ මුව මස් කන්න හරිම ආසයි.



ඒ කාලයේ මුව රැළක් හිටියා. නායක මුවාගේ නම "නන්දිය" නන්දිය මුව රජ්ජුරුවෝ හරිම ලස්සනයි. ඒ නායක මුවාගේ මහලු මවත් පියාත් මේ මුව රැළේ හිටියා.

එක දවසකට එක මුවකු බැගින් දඩයම් කරන්න රජ්ජුරුවෝ අණ කළා. මේ බව නන්දිය මුව රජුට ආරංචි වුණා. මහලු මවත් පියාත් කැළෑවේ හැංගුවා. නන්දිය මුව රජ මුව රැළත් එක්ක රජුගේ උයනට ගියා.

දවසක් රජ්ජුරුවන්ට මෙහෙම හිතුණා. "අද මම ම ගිහින් මුවකු දඩයම් කරන්න ඕනෑ." රජ්ජුරුවෝ දුනු හී අරගෙන උයනට ගියා. මේ බව දුටු මුවෝ බයේ පැන දිවුවා.



4. ර.මු.නී.ය. - 120263

නන්දිය මුව රජ බය නැතිව
රජ්ජුරුවන් ඉදිරියට ආවා.
රජ්ජුරුවෝ දුනු හී ඇදගෙන
හිටියා. "මම කොහොම ද
මේ ලස්සන මුවාට විදින්නේ?"

"මහරජ, විදින්න, මගේ කිසි
තරහක් නැහැ. මම ඔබට
මෙත් වඩනවා," නන්දිය මුව
රජ කීවා.



"මට ඔබට විදින්න බැහැ.
මගේ හීය විදෙන්නේ නැහැ.
මම ඔබට ජීවිත දානය
දෙනවා," රජ්ජුරුවෝ කීවා.

"රජතුමනි, මගේ මුව රැලේ
අනෙක් මුවන්?"
නන්දිය මුව රජ ඇහුවා.
"ඒ මුවන්ටත් ජීවිත දානය
දෙනවා," රජ්ජුරුවෝ කීවා.

"රජතුමනි අහසේ කුරුල්ලන්ටත්,
දියෙහි මාළුවන්ටත්, අනෙක්
සතුන්ටත් ජීවිත දානය දෙන්න.
සියලු ම ජීවිත එක සමානයි"
මුව රජ කීවා.

"සියලු ම සතුන්ට
ජීවිත දානය දෙනවා"
රජ්ජුරුවෝ සතුටෙන්
කීවා.

මුව රැළයි,
නන්දිය මුව රජ්ජුරුවොයි
කැලෑවට ගියා. මහලු
අම්මා, තාත්තා නන්දිය මුව
රජු ආදරයෙන් පිළිගත්තා.



මුව රැළට සිදු වූ දේ
අම්මාටත් තාත්තාටත් කීවා.
"අපේ පුතා හරි හොඳයි.
අපි දෙන්නා විතරක් නොවේ.
හැම සතකුට ම ජීවිත
දානය ලබා දුන්නා."
"ඔබ බෝසත් පුතෙක්,"
අම්මා තාත්තා සතුටෙන් කීවා.

"මෙත් වඩන තැනැත්තාගේ මුහුණ ලස්සන වේ."
- බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක -

# 6. මහාමායා දේවිය දුටු සිහිනය

සුද්ධෝදන රජතුමාගේ
අග බිසව මහාමායා දේවිය යි.
එක් ඇසල පොහොය දවසක
බෝසත්තුමා මහාමායා දේවියගේ
කුසෙහි පිළිසිඳ ගත්තා.
ඒ බව මහාමායා දේවිය සිහිනෙන් ද දුටුවා.



සුදු ඇත් පැටවෙක්
සුදු නෙළුම් මලක් සොඬින් ගෙන
දකුණු ඇලයෙන් මහාමායා දේවියගේ
කුසට ඇතුළු වුණා.

මහාමායා දේවියට උතුම් කුමාරයෙක්
ඉපදෙන බව පඬිවරු කීවා.

# 7. බෝසත් උපත

එදා වෙසක් පෝය දවසයි.
ලුම්බිනී සල් උයන පුරා
මල් පිපිලා.
හරිම ලස්සනයි.
මහාමායා දේවියගේ කුසයෙන්
පින්වත් බෝසත් කුමරු
උපන්නා.




අසිරිමත් සිදුවීමක් !
කුමරු පියුම් හතක්
මත වැඩියා.

අන්තිම පියුම මත
කුමරු නැවතුණා.
නැවති මෙසේ කීවා.

"අග්ගෝ හමස්මි ලෝකස්ස
ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස
සෙට්ඨෝ හමස්මි ලෝකස්ස
අයමන්තිමා ජාති
නත්ථිදානි පුනබ්භවෝ"

"මම ලොවට අග වෙමි.
මම ලොවට දෙටු වෙමි.
මම ලොවට උතුම් වෙමි.
මෙය මාගේ අවසන් උපතයි.
මට නැවත උපතක් නැත."

# 8. අසිරිමත් සිදුවීමක්




බෝසත් කුමරුගේ පියා
සුද්ධෝදන මහ රජතුමා ය.
රජතුමාගේ ගුරුවරයා වූ
අසිත තාපසතුමා
බෝසත් කුමරු බැලීමට
රජ මාලිගාවට ආවා.

සුද්ධෝදන මහ රජතුමා
පුත් කුමරු පෙන්වීමට
වඩාගෙන ආවා.
තාපසතුමාට
වැන්දවීමට සැරසුණා.
එවිට බෝසත් කුමරුගේ පතුල් දෙක
තාපසතුමාගේ හිස මත පිහිටියා.

අසිත තාපසතුමා මෙයින් පුදුමයටත්
සතුටටත් පත් වුණා.
අසුනෙන් නැගිට්ටා.
බෝසත් කුමරුට වැන්දා.

පිය රජතුමා ද
මේ අසිරිමත් සිදුවීම දැක
පුත් කුමරුට වැන්දා.

# 9. බෝසත් කුමරුට නමක්



සුද්ධෝදන රජතුමාගේ මාලිගාවේ
උත්සවයක්.
නෑදෑයෝ, යහළුවෝ, පඬිවරු
මාලිගාවට ආවා.

"පුතාට හොඳ නමක් තියන්න ඕනෑ,"
රජතුමා පඬිවරුන්ට කීවා.
පඬිවරු කුමරුගේ හැඩරුව බැලුවා.

එක් පඬිවරයෙක් හැර
අනෙක් පඬිවරු මෙසේ කීවා.


"මේ උතුම් කුමාරයා
ගිහිගෙයි විසුවොත්
සක්විති රජ වෙනවා
පැවිදි වුවොත් බුදු වෙනවා"

"නෑ නෑ මේ කුමාරයා ඒකාන්තයෙන් ම බුදු වෙනවා"
එක් පඬිවරයෙක් පැවසුවා.

සියලු පඬිවරු මෙසේ පැවසුවා.

"මේ කුමාරයාගෙන් ලොවට යහපතක් ම
සිදු වෙනවා. එම නිසා අපි
"සිද්ධාර්ථ" යන නම තබමු"

# 10. අපේ හාමුදුරුවෝ



පුතා - අම්මේ, අද අපේ පන්තියට
හාමුදුරුනමක් වැඩියා.

අම්මා - මොකට ද පුතේ වැඩියේ?

පුතා - බණ කතාවක් කියා දෙන්න.

අම්මා - හාමුදුරුවෝ වඩින කොට පුතාලා මොකද
කළේ ?

පුතා - අපි ඉඳගෙන හිටිය තැන්වලින් නැගිට්ටා.
හාමුදුරුවන්ට වැඳලා ඉඳගත්තා.
අම්මා - පුතාලා හාමුදුරුවන්ට මොනවද පූජා කළේ?
පුතා - ගිලන්පස පූජා කළා. පිරිකර පූජා කළා.
අම්මා - පුතේ හාමුදුරුවරු හරි හොඳයි.
බණ දහම් කියා දෙනවා.

හාමුදුරුවන්ට ගරු කරන්න ඕනෑ.
පුතාලගේ පාසල හරි ම හොඳයි

# 11. මව්පියනට කීකරු වෙමු

එකමත් එක රටක
කැලෑවක ගිරා
පවුලක් හිටියා.
ගිරා තාත්තා මහලුයි, අන්ධයි.
ගිරා අම්මාත් මහලුයි.
ගිරා පුතා
පලවැල ගෙනැවිත්
අම්මාටත් තාත්තාටත්
කවනවා.






එක දවසක් මේ ගිරා පුතා
මුහුද මැද දූපතකට පියාඹාගෙන ගිය
ඒ දූපතේ තිබුණු
අඹ කෑවා. ඒවා හරි රසයි.
අම්මාටත් තාත්තාටත් අඹ අරගෙන
ආපසු ආවා.

"මේ අර දූපතේ අඹ ගහේ
ගෙඩියක් නේ ද?"
අන්ධ තාත්තා අඹ ගෙඩිය
කාපු ගමන් ඇහුවා.

"ඔව් තාත්තේ, මේ ඒ
දූපතේ අඹ ගහේ ගෙඩි තමයි "
ගිරා පුතා කීවා.
"මගේ පුතේ, ඒ අඹ ගහේ ගෙඩි
රසයි. ඒත් ඒ දූපතට යන
එක අනතුරුදායකයි"
තාත්තා කීවා.
"ආයෙ නම් ඒ දූපතට යන්න
එපා, මගේ පුතේ"
තාත්තා ආදරයෙන්
අවවාද කළා.





ගිරා පුතාට
දවසක් අර රස
අඹ කන්න හිතුණා.
මුහුද මැද දූපතට
පියාඹාගෙන ගියා.
ටික දුරක් යන කොට
මහා හුළඟක් ආවා.
ගිරා පුතා
හුළඟට අහු වුණා.
පියාඹන්න බැරුව ගියා.
ගිරා පුතා මුහුදට වැටුණා.

අනේ, තාත්තා කියූ දේ
නො ඇසූ ගිරා පුතාට
වූ විපතක තරම!

# 12. ගරු කිරීම




මහලු වී සිටියත් - රුවෙන් අඩු වී සිටියත්
දුප්පත් ව සිටියත් - දෙමව්පිය වැඳ පුදනු යහපත්

ගුරුන් සිත නොරිදනු - කීකරුකමින් පවතිනු
එකට එක නොකියනු - සතුටු මුහුණක් නිතර පෙන්වනු

මව්පිය දෙදෙනවත් - තමන් ගුරුවරයෙක්වත්
නුඹ වරද ඇසුවොත් - නොසඟවා එය කියනු යහපත්

"හොඳින් ඉගෙනීම ගුරුතුමාට කරන සැලකීමකි"
- බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක -

# 13. තෙරුවන් සරණයි



මගේ දූලා පුතාලා හරි හොඳයි.
පාසලට එනකොට
අම්මාට තාත්තාට වැඳලනෙ එන්නේ.

ගුරුතුමා : සමන් පුතා, කියන්න බලන්න අම්මාට තාත්තාට වදින කොට ඒ දෙන්නා මොනව ද කීවේ ?

සමන් : "මගෙ පුතාට තෙරුවන් සරණයි කිවුවා."

ගුරුතුමා : බොහොම හොඳයි, ධම්මිකා දුව වදින කොට මොනව ද කීවේ ?

ධම්මිකා : "මගෙ දුවට දළදා හාමුදුරුවන්ගේ පිහිටයි" කිවුවා.

ගුරුතුමා : හරිම හොඳයි.

ගුරුතුමා : ප්‍රදීපා වඳින කොට මොනව ද කීවේ?

ප්‍රදීපා : "ජයසිරි මහා හාමුදුරුවන්ගේ පිහිටයි" කිවුවා.
සමහර දවස්වලට
"බුදු සරණයි" කියලත් කියනවා.


ගුරුතුමා : අපි හැමදා ම "තෙරුවන් සරණයි" කියා වැඩ පටන් ගනිමු. වැඩ අවසන් කරන කොටත් "තෙරුවන් සරණයි" කියමු.
යාළුවන්ටත් "තෙරුවන් සරණයි" කියමු.

"අනුන්ට උපකාර කිරීමෙන් පින් සිදු වේ
අනුන්ට පීඩා කිරීමෙන් පව් සිදු වේ"

- බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක -

# 14. ලොකු තෑග්ගක්

ඉස්සර කාලයේ සිටුවරයෙක් මෙහෙම කීවා.
"කරත්ත සියයක් එක වර
ඇදගෙන යන්න පුළුවන්
ගවයෙක් සිටිනවා නම්,
ගවයාගේ අයිතිකාරයාට
ලොකු තෑග්ගක් දෙනවා"





ඒ රටේ
මිනිසකුට "නන්දිවිසාල"
නමින් ගවයෙක් සිටියා. ඔහු
තම ගවයාට දරුවෙකුට
මෙන් සැලකුවා. ඒ නිසා
නන්දිවිසාල ගවයා
හොඳින් උස් මහත් වී
වැඩුණා.


දිනක් නන්දිවිසාල
ගවයාගේ අයිතිකාරයා සිටුවරයා
හමුවට ගියා.
"මගේ ගවයාට කරත්ත සියය ම
එකවර අදින්න පුළුවන්" කීවා.






කරත්ත සියයක් එකවර
අදින ගවයා බලන්න
මිනිස්සු නගරයට රැස් වුණා.
නන්දිවිසාල ගවයා
මුල් කරත්තයේ ගැට ගැහුවා.
කෝටුවක් අරගෙන කෑ ගැහුවා.
කරත්තය අදින්න
අමිහිරි වචනවලින් අණ දුන්නා.

එම අමිහිරි වචන නිසා නන්දිවිසාලගේ
හිත රිදුණා. නන්දිවිසාල පාරේ දණ
ගැහුවා. "අමිහිරි වචනවලින් කතා
කල නිසා වෙන්න ඇති නන්දිවිසාල
පාරේ දණ ගැහුවේ.
"මගෙන් ලොකු වැරැද්දක් වුණා."
ස්වාමියා දුක් වුණා. පසුව ඔහු නන්දිවිසාල ළඟට ආවා.
ආදරයෙන් ගවයාගේ හිස අත ගෑවා.
"අපි යමු පුතා" කියා මිහිරි වචනවලින්
කතා කර කීවා.



නන්දිවිසාල සතුටෙන් නැගිට්ටා.
මුල් කරත්තය ඇද්දා. කරත්ත සියය ම
යන්න පටන් ගත්තා. බලාගෙන හිටපු
මිනිස්සු සතුටෙන් කෑ ගැසුවා.

සිටුවරයා ගවයාගේ දස්කම් අගය කළා.
ස්වාමියාට තෑග්ග ලැබුණා. මේ දෙස
බලාගෙන හිටපු අය මෙසේ කීවා.
"නන්දිවිසාලට මුලින් අමිහිරි වචනවලින්
කතා කළා. කරත්තය ඇද්දේ නෑ.
පස්සේ මිහිරි වචනවලින් කතා කළා.
කරත්ත සියය ම ඇද්දා.
මිහිරි වචනවලින් කතා කරන එක
කොච්චර හොඳ ද?"




"හොඳ වචන කතා කිරීම දියුණුවට හේතු වේ"

- බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක

# 15. දළදා මාළිගාව

දළදා මාළිගාව තිබෙන්නේ මහනුවරයි.
අපේ බුදුරජාණන් වහන්සේගේ
දන්ත ධාතූන් වහන්සේ වැඩ සිටින
නිසා මෙය දළදා මාළිගාව නමින්
හඳුන්වනවා.



දඹදිව සිට දළදා වහන්සේ රැගෙන
ආවේ හේමමාලා කුමරිය හා දන්ත කුමරුයි.
අපේ රජවරු දළදා වහන්සේ
ආදරයෙන් රැක ගත්තා.
අපේ රටේ වටිනා ම වස්තුව
දළදා වහන්සේ බවට පත් වුණා.
අපි අද මහනුවර දළදා මාළිගාවේ දී
වඳිනුයේ පුදනුයේ එම දළදා වහන්සේටයි.

# 16. මහියංගනය



එදා දුරුතු පුර පසළොස්වක
පොහොය දවසක්.
එදා ලක්දිව මහියංගනයේ
"මහානාග වන" උයනේ යක්ෂ නමින්
හැඳින්වූ පිරිසකගේ
විශාල රැස්වීමක් පැවැත්වුණා.

අපේ බුදුරජාණන් වහන්සේ ද
දඹදිව සිට මහියංගනයේ
මහානාග වනයට වැඩම කළා.
බුදුරජාණන් වහන්සේ පළමු වරට
ලක්දිවට වැඩියේ එදායි.

බුදුරජාණන් වහන්සේ මෙම
පිරිසට බණ දේශනා කළා.

මේ කාලයේ ලක්දිව සමනල
අඩවියේ සුමන නම් දෙවි කෙනෙක් හිටියා.
බුදුරජාණන් වහන්සේ මහියංගනයට වැඩිය
බව සුමන දෙවියන් දැන ගත්තා.

විශාල පිරිසක් ද සමඟ සුමන දෙවියෝ
මහියංගනයට පැමිණියා.

බුදුරජාණන් වහන්සේ
සුමන දෙවියන් ඇතුළු පිරිසට
බණ දේශනා කළා.

පසුව සුමන දෙවියන්
බුදුරජාණන් වහන්සේගෙන්
වැඳීමට පිදීමට යමක් ඉල්ලා සිටියා.
එවිට බුදුරජාණන් වහන්සේ කේසධාතු මිටක්
දුන්නා.

සුමන දෙවියෝ බොහෝ සතුටට පත් වුණා.
එම කේසධාතු නිදන් කොට මහියංගනයේ
වෙහෙරක් හැදුවා.

අද අපි මහියංගනයේ දී වඳිනුයේ
පුදනුයේ එම වෙහෙර වහන්සේටයි.

# 17. කැලණි විහාරය

ඉස්සර මණිඅක්ඛික නම් රජ කෙනෙක් රජකම් කලා. ඔහු රජකම් කලේ කැලණිය ප්‍රදේශයේ යි.



බුදුරජාණන් වහන්සේ දෙවන වර ලක්දිවට වැඩියේ නාගදීපයටයි. ඒ වෙලාවේ මණිඅක්ඛික රජතුමා ද නාගදීපයට ගියා. බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා පැහැදුණා. කැලණියට ද වඩින ලෙස බුදුරජාණන් වහන්සේට ආරාධනා කලා. බුදුරජාණන් වහන්සේ ඒ ආරාධනාව පිළිගත්තා.

බුදුරජාණන් වහන්සේ බුදු වී අට වන අවුරුද්දේ වෙසක් පුර පසලොස්වක පොහොය දිනය උදා වුණා. මණිඅක්ඛික රජතුමාගේ ආරාධනය නිසා බුදුරජාණන් වහන්සේ කැලණියට වැඩම කලා. උන්වහන්සේ වැඩියේ තවත් රහතන් වහන්සේලා පන්සියයක් ද සමගයි.

රජතුමා බුදුරජාණන් වහන්සේ ඇතුළු පිරිස පිළිගෙන විශේෂ මණ්ඩපයකට වැඩමවාගෙන ආවා. දානය පිරිනැමුවා. පසුව බුදුරජාණන් වහන්සේ රජු ඇතුළු පිරිසට බණ දේශනා කළා.



බුදුරජාණන් වහන්සේ වැඩ සිටියේ
රජු සාදවා තිබුණු වටිනා මැණික්
පුටුවකයි. මණිඅක්ඛික රජ
බුදුරජාණන් වහන්සේ වැඩ සිටිමින්
බණ දේශනා කළ තැන විශාල වෙහෙරක්
හැදුවා. එහි නිදන් කළේ
බුදුරජාණන් වහන්සේ වැඩ සිටිය
මැණික් පුටුවයි.

අපි අද කැලණියේ දී වඳිනුයේ පුදනුයේ
එම වෙහෙර වහන්සේටයි.